# දෙම්පෙ ප්‍රාදේශීය සභාව

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම.

දෙම්පෙ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු පවතින තනතුරු වර්ග හා ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය | සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | කාර්යාල කාර්යය සහායක | 01 | රු. 24250-10x250-10x270-10x300-12x330 (PL 1-2016) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.) | (1) අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස (සාපෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හය (6) ක් සමත් වී තිබීම. (මින් විෂයන් පහ (5) ක් එකවර සමත් විය යුතුය.)<br>(2) වෘත්තිය සුදුසුකම් - අදාළ නැත<br>(3) පළපුරුද්ද - අදාළ නැත<br>(4) බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ.<br>(4.1) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : |

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| 2. ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| 3. පෞරුෂත්වය | 05 | |

<table>
<tr><th>තනතුර</th><th>තනතුරු සංඛ්‍යාව</th><th>වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය</th><th>සුදුසුකම්</th></tr>
<tr><td>02. මුරකරු III</td><td>02</td><td>රු. 24,250-10x250-10x270-10x300-12x330 (PL 1-2016) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)</td><td>
(1) අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (6) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (5) ක් එකවර සමත් විය යුතු ය.)<br>
(2) වෘත්තීය සුදුසුකම් : අදාළ නැත<br>
(3) පළපුරුද්ද : අදාළ නැත<br>
(4) බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ.<br>
(4.1) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
<table>
<tr><th>ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>1. බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්</td><td>20</td><td rowspan="2">50%</td></tr>
<tr><td>2. ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය</td><td>75</td></tr>
<tr><td>3. පෞරුෂත්වය</td><td>05</td><td></td></tr>
</table>
</td></tr>
<tr><td>03. වැඩ/ක්ෂේත්‍ර කම්කරු</td><td>05</td><td>රු. 24,250-10x250-10x270-10x300-12x330 (PL 1-2016) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)</td><td>
(1) අධ්‍යාපන සුදුසුකම් : 8 වන ශ්‍රේණිය (9 වසර සමත් විය යුතු ය)<br>
(2) වෘත්තීය සුදුසුකම් : අදාළ නැත<br>
(3) පළපුරුද්ද : අදාළ නැත<br>
(4) බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ.<br>
(4.1) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
<table>
<tr><th>ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>1. පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය</td><td>15</td><td rowspan="4">50%</td></tr>
<tr><td>2 තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික</td><td>05</td></tr>
<tr><td>3. ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය</td><td>75</td></tr>
<tr><td>4. පෞරුෂත්වය</td><td>05</td></tr>
</table>
</td></tr>
</table>

| තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය | සුදුසුකම් |
|---|---|---|---|
| 04. සෞඛ්‍ය කම්කරු | 05 | රු. 24,250-10x250-10x270-10x300-12x330 (PL 1-2016) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.) | (1) අධ්‍යාපන සුදුසුකම් : 8 වන ශ්‍රේණිය (9 වසර සමත් විය යුතුය)<br>(2) වෘත්තීය සුදුසුකම් : අදාළ නැත<br>(3) පළපුරුද්ද : අදාළ නැත<br>(4) බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ. |

(4.1) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය | 15 | 50% |
| 2 තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| 3. ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| 4. පෞරුෂත්වය | 05 | |

*සටහන* - පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බලනු ලැබේ.

05. *තනතුරු සඳහා වෙනත් සුදුසුකම් :*

1. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
2. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නව වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතු ය.
4. අවම වයස - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවු. 18 ට නොඅඩු විය යුතුය. උපරිම වයස : අවු. 45ට නොවැඩි විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ, පළාත් හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු ය.
6. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
7. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් හා වයස අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට, එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් වේ. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
2. බඳවාගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
3. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත් විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත් දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතු ය.

සැ.යු. - මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ විධි විධාන වලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ දොම්පෙ ප්‍රාදේශීය සභාව විසින් වරින්වර පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

07. *බඳවා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කල යුතු ආකාරය :*

(07.1) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක (අංක 01 සිට 10 දක්වා එක පැත්තක ද අංක 11 සිට ඉදිරියට අනෙක් පැත්තද) වනසේ කඩදාසියේ දෙපැත්තේ අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කල යුතු ය.

(07.2) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කොට 2017.10.06 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, දොම්පෙ ප්‍රාදේශීය සභාව, කිරිඳිවැල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු ය.)

(07.3) තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(07.4) අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික පිටපත් එවිය යුතු ය.

- *(අ)* උප්පැන්න සහතිකය ;
- *(ආ)* ජාතික හැඳුනුම්පත ;
- *(ඇ)* අධ්‍යාපන සහතික හෝ ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන වෙනත් සහතික ;
- *(ඈ)* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කල තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කල පදිංචිය පිළිබඳ සහතිකය ;
- *(ඉ)* මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක්.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

එම්. යූ. ආර්. මද්දුමගේ,
ලේකම් හා සභාවේ බලතල,
කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

දිනය - 2017 අගෝස්තු මස 21 වැනි දින
දොම්පෙ ප්‍රාදේශීය සභාවේ දී ය.

### ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ

.......................................................................... *තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :————
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————
4. ස්ථිර ලිපිනය හා දුරකථන අංකය :————
5. ජාතික හැඳුනුම්පත් අංකය :————
6. උපන් දිනය - අවුරුද්ද:———— මාසය:———— දිනය :————
7. ස්ත්‍රී/පුරුෂ භාවය :————

8. ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස - අවුරුදු:———— මාස:———— දින:————

9. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කාලය :————

10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග :————

11. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය)

*(අ)* සමත් වූ වසර :———— ශ්‍රේණිය :————

*(ආ)* විභාග අංකය :———— වර්ෂය :————

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. *ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? තිබේනම් ඒ පිළිබඳ විස්තර :*

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු සපයා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් මම දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

09-65